# කොරියානු භාෂා පරීක්ෂණය නිවේදනය කිරීම-2023

## (නිෂ්පාදන සහ ධීවර ක්ෂේත්‍ර සඳහා)

දකුණු කොරියාවේ රැකී රක්ෂා සහ කම්කරු අමාත්‍යාංශයත්(MOEL) ශ්‍රී ලංකාවේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයත් (MFE) අතර අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ඇගයුම් මත ලකුණු ලබාදීම මගින් ශ්‍රමිකයින් බඳවා ගැනීම සඳහා වන ක්‍රමවේදය මෙම වසරේදීත් ක්‍රියාත්මක කිරිමට තීරණය කර ඇත.

මෙම ඇගයුම් මත ලකුණු ලබාදීමේ ක්‍රමය මගින් අපේක්ෂකයින් සතු කොරියානු භාෂා හැකියාව පමණක් නොව කුසලතාවය, කායික තත්ත්වය සහ වැඩ පළපුරුද්ද පිළිබඳ ගැඹුරින් සොයා බලනු ලැබේ.

අපේක්ෂකයින්ගේ කායික තත්ත්වයන් පරික්ෂා කිරීමේදී වර්ණ අන්ධතාවය සහ වර්ණ දුර්වලතා සහිත අයට මේ සඳහා ඉදිරිපත් වීමට අවසර නොලැබේ. තවද කොඳු ඇට පෙළේ ආබාධ සහ ඇඟිලි අඩු හෝ කැපුණු අයට පරීක්ෂණයට ඉදිරිපත් වීමට අවසර නොලැබේ.

අදාළ කර්මාන්ත සඳහා  රැකියා අපේක්ෂිතයින් තෝරාගනු ලබන්නේ ඔවුන් ලබාගන්නා ඉහළ ලකුණු මට්ටම අනුව වේ. පළමු වටය සමත්වීම සඳහා අපේක්ෂකයින් විසින් අවම ලකුණු මට්ටමට වඩා ඉහළින් සිටිය යුතුයි. (අවම ලකුණ, නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා ලකුණු 100න් 55 ක්ද , ධීවර ක්ෂේත්‍රය සඳහා ලකුණු 90 න් ලකුණු 36ක්ද වේ) ඉන්පසු දෙවන වටය සඳහා (කුසලතා පරීක්ෂණය) තෝරාගනු ලබන්නේ අවසානයේ සමත් කිරීමට නියමිත සංඛ්‍යාවෙන් 110% ක ප්‍රතිශතයක් පමණි.

පළමු වටයේ සමත් වන්නන් හට කුසලතා පරීක්ෂණයක් හා නිපුණතා පරීක්ෂණයකින් සමන්විත දෙවන වටය සඳහා අවස්ථාව ලැබේ.කුසලතා පරීක්ෂණයේදී අවම වශයෙන් නියමිත ලකුණු ප්‍රමාණය ලබාගත යුතු අතර දෙවන වටයේදී පරීක්ෂණ දෙකෙහිම ලකුණු එකතු කරනු ලැබේ.

ඒ අනුව, සියලුම පරීක්ෂණ වලට ලැබෙන ලකුණු එකතු කර ඉහලම ලකුණු ගන්නා අය ඇගයුම් ක්‍රමවේදය මගින් සමත් කරනු ලැබේ .

මෙම පරීක්ෂණ ක්‍රියාවලියේ, දෙවන වටය තුළදී අපේක්ෂකයින් තමා තෝරාගත් කර්මාන්තයට අදාළව සේවා පළපුරුද්ද, ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් සහ ක්ෂේත්‍රයට අදාළව පුහුණු පාඨමාලා සම්පූර්ණ කර තිබේ නම්, නිපුණතා පරීක්ෂණය සඳහා එම ලේඛණ ඉදිරිපත් කළ හැකිය. පළමු අදියරට අදාළ පරීක්ෂණය සමත් වූවන්ට පමණක් කුසලතා පරීක්ෂණයට ඉදිරිපත් විය හැකිය.කුසලතා පරීක්ෂණයට සහභාගී නොවන අයදුම්කරුවන් විභාගය සමත් වීමට සුදුසුකම් නොලබයි.

අපේක්ෂකයින් විසින් EPS පරීක්ෂණයේ විභාග අයදුම්පත් ඉල්ලුම් කිරීමට පෙර තමාගේ වර්ණ අන්ධභාවය සහ වර්ණ  දුර්වලතා පිළිබඳ තත්ත්වයන් පරික්ෂා කරගත යුතුය.

තවද, වර්ණ අන්ධභාවය සහ වර්ණ දුර්වලකම් ඇති අය කුසලතා පරීක්ෂණයේදී හඳුනාගනු ලැබුවහොත් විභාගය සමත් කරනු නොලැබේ.එසේම යම් අපේක්ෂකයෙකුගේ කායික තත්ත්වය ඉල්ලුම් කරන ලද ක්ෂේත්‍රය සඳහා  සුදුසු නොවන බව තීන්දු වුවහොත් එම පිරිසද මෙම තෝරාගැනීම් වලින් ඉවත් කරනු ලැබේ.

2023 පෙබරවාරි 01

විභාගය පැවැත්වීම : රැකීරක්ෂා හා  කම්කරු අමාත්‍යාංශය -දකුණු කොරියාව

ක්‍රියාත්මක කිරීම : කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනය

සහයෝගීතාවය : කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**විදේශීය ශ්‍රමිකයින් බඳවාගැනීම සඳහා**

## 1. පරමාර්ථ

පෙර ක්‍රියාත්මක වූ EPS - TOPIK ක්‍රමවේදය තුළ තිබෙන රැකියා අපේක්ෂිත ලැයිස්තුව මගින් කොරියානු සේවා යෝජකයින්ට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් වන කාර්ය පැවරුම් සම්පූර්ණ කිරීමේ කාර්යක්ෂමතාවය, පුද්ගල කායික සුදුසුකම් සහ කර්මාන්තයට අදාල අත්දැකීම් නිරීක්ෂණය කිරීමට හැකියාවක් නැත.

කොරියානු භාෂාව කථාකිරීම අඩු මට්ටමක පවතින,නමුත් කාර්ය සාධනයේදී නිපුණතා මට්ටම ඉහල අයට පෙර ක්‍රියාත්මක වූ EPS ක්‍රමය තුළ ලැබෙන අවස්ථා සීමිත වී ඇත.

මෙම සීමාවන් මඟහරවා ගැනීම සඳහා කොරියාවේ මානව සම්පත් සංවර්ධන අංශය මගින් නව ක්‍රමවේදයක් ලෙස මෙය හඳුන්වාදී තිබේ. එමගින් ශ්‍රමිකයාගේ තත්ත්වයන් පිළිබඳව සංකීර්ණ ලෙස ඇගයීමට භාජනය කරනු ලැබේ. භාෂා හැකියාව පමණක් නොව සේවා පලපුරුද්ද,ජාතික සහතික,පුහුණු පාඨමාලා සහ කුසලතා සඳහා එහිදී ලකුණු හිමි වේ.

මෙම ක්‍රමය,සේවා යෝජකයින්ට ඔවුන් අපේක්ෂිත සුදුසු ශ්‍රමිකයන් තෝරා ගැනීමට උපකාරී වේ.

මෙම ක්‍රමවේදය මගින් කොරියානු භාෂාවට ලකුණු අඩුවෙන් ගන්නා , එහෙත් රැකියා තුළ අති දක්ෂ සාධන මට්ටම් සහිත අයවලුන් සඳහා වැඩි අවස්ථා ලැබේ.




## 2. විදේශ ශ්‍රමිකයන් සඳහා වන ඇගයුම් පාදක ලකුණු ක්‍රමයේ අන්තර්ගතය

- බඳවාගන්නා ක්‍රමවේදය :
  1 පළමු වටයේ පරීක්ෂණ (EPS-TOPIK)
  2 දෙවන වටයේ පරීක්ෂණ ( කුසලතා පරීක්ෂණය + නිපුණතා පරීක්ෂණය)
  3. ලකුණු එකතු කිරීම

- අවසාන සාමාර්ථලාභීන් තීරණය කිරීම : උපරිම ලකුණු ලබාගැනීම අනුව (වැඩිම ලකුණු අනුපිළිවෙල මත) සමාර්ථලාභීන් තීරණය කෙරේ.

### කර්මාන්ත අනුව ලකුණු ව්‍යාප්තිය

| කර්මාන්තය | මුළු ලකුණු | EPS-TOPIK ලකුණු | කුසලතා පරීක්ෂණය | නිපුණතා පරීක්ෂණය (අමතර ලකුණු) | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | රැකියා පළපුරුද්ද (වසරක් හෝ ඊට වැඩි) | පුහුණු/ අධ්‍යාපනික පසුබිම | | රජයෙන් නිකුත් කරන සහතික |
| | | | | | වෘත්තීය පුහුණු සහතික (පැය 120 ක් හෝ ඊට වැඩි) | අධ්‍යාපනික පසුබිම (උපාධි හෝ ඉන් ඉහළ) | |
| **නිෂ්පාදන** | **ලකුණු 200** | **ලකුණු 100** | **ලකුණු 100** | ලකුණු 03 | ලකුණු 01 | ලකුණු 01 | ලකුණු 01 |
| ධීවර | **ලකුණු 200** | **ලකුණු 90** | **ලකුණු 110** | ලකුණු 03 | ලකුණු 01 | ලකුණු 01 | ලකුණු 01 |

**3. පරීක්ෂණයේ පළමු වටය(EPS – TOPIK)**

- **පරීක්ෂණ කාල පරිච්ඡේදය (ප්‍රශ්න) :** මිනිත්තු 50 [කියවීම (ප්‍රශ්න 20), මිනිත්තු 25 , සවන්දීම (ප්‍රශ්න 20 ) මිනිත්තු 25],

- **පරීක්ෂණයේ ස්වභාවය :**
  බහුවර්ණ ප්‍රශ්ණ , සවන්දීම සඳහා වන විභාගය කියවීම පිළිබඳ විභාගයෙන් පසුව පවත්වයි

- **කර්මාන්ත අනුව ලකුණු ව්‍යාප්තිය:**

  **පලමු වටයේ පරීක්ෂණයේ දී නිෂ්පාදන අංශය සඳහා අවම වශයෙන් ලකුණු 55 ක් ද, ධීවර ක්ෂේත්‍රය සඳහා ලකුණු 36ක් ද ලබාගත යුතු ය.**

**04. දෙවන වටය පරීක්ෂණය පැවැත්වීම ( කුසලතා පරීක්ෂණය +නිපුණතා පරීක්ෂණය)**

**01.කුසලතා පරීක්ෂණය**

- කුසලතා පරීක්ෂණය අවශ්‍ය වන කර්මාන්තය: -නිෂ්පාදන ,ධීවර

කුසලතා පරීක්ෂණය කොටස් තුනකින් යුක්ත වේ.

01.කායික ශක්තිය
02.සම්මුඛ පරීක්ෂණය
03.මූලික කුසලතා

- **ඇගයීම් ලකුණු ව්‍යාප්තිය**

| කර්මාන්තය | එකතුව | කුසලතා පරීක්ෂණය | | |
|---|---|---|---|---|
| | | කායික පරීක්ෂණය | සම්මුඛ පරීක්ෂණය | මූලික කුසලතා |
| **නිෂ්පාදන** | 100 | 30 | 30 | 40 |
| **ධීවර** | 110 | 30 | 30 | 50 |

කුසලතා පරීක්ෂණයේදී ලකුණු 60කට අඩුවෙන් ලබාගන්නා අය අවසන් වටයේදී අසමත් කරනු ලැබේ.

**02. නිපුණතා පරීක්ෂණය**

- **ඉලක්කය:- (EPS – TOPIK පරීක්ෂණය සමත්වූවන්)**
  මෙම පරීක්ෂණයට සුදුසුකම් ලබන්නේ, පලමු වටයේ පරීක්ෂණය සමත්, තෝරාගත් කර්මාන්තයේ සේවා පලපුරුද්ද සහිත,ජාතික මට්ටමේ සහතිකපත් හිමි සහ කර්මාන්තයට අදාල පුහුණු පාඨමාලා සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින් ය.

- මෙම පරීක්ෂණය සඳහා ඉදිරිපත් විමේදී සම්පූර්ණ කල යුතු ලේඛණ පිළිබඳ තොරතුරු **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියෙන්(www.slbfe.lk)** ලබාගත හැකියි. මෙම ලේඛණ අපේක්ෂකයන් විසින් සම්පූර්ණ කර අදාළ ලේඛණ සමඟ ඉදිරිපත් කළ යුතුය. (සේවා පලපුරුද්ද සනාථ කිරීම සඳහා සේවා සහතිකය,ඩිප්ලෝමා පාඨමාලා (නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා) ,ජාතික මට්ටමේ සහතික )

- යම් අපේක්ෂකයෙක් **ඉල්ලුම් කළ කර්මාන්තයට** අදාලව පුහුණුව නොලබා තිබේ නම්,සහතික නොමැති නම් හා සේවා පළපුරුද්ද නොමැති නම් ,මෙම නිපුණතා පරීක්ෂණයට අදාළ අයදුම්පත්‍ර සම්පූර්ණ නොකළ යුතු අතර නිපුණතා පරීක්ෂණය සඳහා පෙනී සිටීම අවශ්‍ය නොවේ.

**නියමිත දිනය:-** දෙවන වටයේ පරීක්ෂණය පැවැත්වෙන අවසාන දිනය දක්වා මෙම පරීක්ෂණය ලේඛණ ඉදිරිපත් කල හැකිය.

**03.නිපුණතා පරීක්ෂණය සඳහා භාරදුන් ලේඛණ/ සහතික පරීක්ෂා කර බැලීමේ ක්‍රමවේදය**

- යම් අපේක්ෂකයෙක් විසින් ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබුණහොත් එම අයගේ ප්‍රතිඵල අවලංගු කරන අතර,ලැයිස්තුවෙන් නම ඉවත් කරනු ලැබේ. තවද එවැනි අයට **වසර හතරක්** යන තුරු නැවත EPS ක්‍රමයට අයදුම් කිරිමද තහනම් කරනු ඇත.

| ප්‍රථම අදියර | දෙවන අදියර | තුන්වන අදියර |
|---|---|---|
| | | |

| | | |
|---|---|---|
| ලබාදී ඇති ලේඛණ සහ සහතික **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්** පරීක්ෂා කරන අතර , ඒවා නිවැරුදිද යන්න තවදුරටත් තහවුරු කිරීමට කටයුතු කරනු ලැබේ. | කර්මාන්තයට අදාල වන ප්‍රශ්න සම්මුඛ පරීක්ෂණයේ දී අසනු ලැබේ. ( කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ නිලධාරීන් විසින්) | කුසලතා පරීක්ෂයෙන් පසුව තවදුරටත් භාරදුන් ලේඛණ වල යම් ගැටළු ස්වභාවයක් තිබේ ද යන්න පරීක්ෂා කරනු ලබයි.( (කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය+ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්) |

**01 .පරීක්ෂණයේ පළමු වටය**

ප්‍රථම වටයේ පරීක්ෂණය පවත්වනු ලබන ක්‍රියා පිළිවෙල(EPS-TOPIK )

- **පළමු වටයේ පරීක්ෂණය නිවේදනය කිරීම:-2023 පෙබරවාරි මස 01**
- **පළමු වටය සඳහා අයදුම්පත් නිකුත් කිරීම: - 2023 පෙබරවාරි මස 13 සිට 2023 පෙබරවාරි මස 22 දක්වා**
- **පරීක්ෂණය පවත්වන ස්ථානය හා දිනය පිළිබඳව දැනුම් දීම:2023 මාර්තු 06**

**▪ කොරියානු භාෂා පරීක්ෂණය පැවැත්වීම (පරිගණක ආශ්‍රිතව)**

**- (නිෂ්පාදන-පළමු වටය') මාර්තු 13 ~ මැයි 30,2023**

**- (නිෂ්පාදන-දෙවන වටය) ජුනි 01 ~ අගෝස්තු 30, 2023**

**- (ධීවර ) සැප්තැම්බර් 01 ~ නොවැම්බර් 30, 2023**

**▪ (EPS-TOPIK) ප්‍රතිඵල නිවේදනය කිරීම**

**- (නිෂ්පාදන-පළමු වටය) ජුනි 5, 2023**

**- (නිෂ්පාදන-දෙවන වටය) සැප්තැම්බර් 5, 2023**

**- (ධීවර) -දෙසැම්බර් 05, 2023**

**▪ නිපුණතා පරීක්ෂණය සඳහා ලේඛණ භාර ගැනීම**

**- (නිෂ්පාදන-පළමු වටය) ජුනි 19 ~ ජුනි 22,2023**

**- (නිෂ්පාදන-දෙවන වටය) සැප්තැම්බර් 18 ~ සැප්තැම්බර් 21 ,2023**

**- (ධීවර) දෙසැම්බර් 11 ~ දෙසැම්බර් 13, 2023**

**▪ කුසලතා පරීක්ෂණය පැවැත්වීම නිවේදනය කිරීම**

**- (නිෂ්පාදන-පළමු වටය) ජුලි 03,2023**

**- (නිෂ්පාදන-දෙවන වටය) ඔක්තොම්බර් 02,2023**

**- (ධීවර) දෙසැම්බර් 18,2023**

**▪ කුසලතා පරීක්ෂණය පැවැත්වීම**

- (නිෂ්පාදන-පළමු වටය) ජුලි 10 ~ ජුලි 24,2023

- (නිෂ්පාදන-දෙවන වටය) ඔක්තොම්බර් 10 ~ ඔක්තොම්බර් 23, 2023

- (ධීවර) දෙසැම්බර් 21~ දෙසැම්බර් 29,2023

▪ප්‍රතිඵල නිවේදනය කිරීම

- (නිෂ්පාදන-පළමු වටය) අගෝස්තු 2, 2023

- (නිෂ්පාදන-දෙවන වටය) නොවැම්බර් 08, 2023

- (ධීවර) ජනවාරි 10, 2024

1. විභාගය සමත් කිරීමට අපේක්ෂිත සංඛ්‍යාව

| කර්මාන්ත | සමත් කිරීමට අපේක්ෂිත සංඛ්‍යාව | | ප්‍රමිතිය |
|---|---|---|---|
| | මුළු එකතුව | 8,028 | |
| නිෂ්පාදන | එකතුව | 7,069 | පලමු වටයේ සහ දෙවන වටයේ ප්‍රතිඵල එකතු කර ලබාගත් ලකුණු වල ඉහළම ලකුණු අනුව සමත් සංඛ්‍යාව තීරණය වේ. |
| | පලමු වටය | පසුව දැනුම් දීමට නියමිතය. | |
| | දෙවන වටය | | |
| ධීවර | - | 959 | |

2. කර්මාන්ත සහ උප කොටස්

○ අපේක්ෂකයා විසින් එක් කර්මාන්තයක් පමණක් සහ එක් අනු ක්ෂේත්‍රයක් තෝරා ගත යුතුය. කොරියානු භාෂා පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කළ පසුව තෝරාගත් ක්ෂේත්‍රයන් වෙනසක් කළ නොහැක . ( අනු ක්ෂේත්‍රයන් පමණක් දෙවන වටයේ අයදුම්පත් භාරගැනීමේදී වෙනස් කළ හැකිය.)

- **නිෂ්පාදන අංශයේ අනු කොටස් - 1.එකලස් කිරීම 2. මැනීම් කටයුතු 3. එකතු කිරිම**

- ධීවර අංශයේ අනු කොටස් -1. මුහුදු වගාව 2. ගැඹුරු සහ නොගැඹුර මුහුද ආශ්‍රිත ධීවර කටයුතු

○ **එක් අපේක්ෂකයෙක් සුදුසුකම් ලබන්නේ එක් අයදුම්පතකට පමණි. අයදුම්පත් කිහිපයක් ඉදිරිපත් කිරීම තහනම් වේ.**

**3 . සුදුසුකම්**

a) වයස- අවුරුදු 18 ත් 39 ත්අතර ( 1983 පෙබරවාරි 14 සිට 2005 පෙබරවාරි 13 දක්වා)
b) සිරදඬුවම් හෝ බරපතල දඬුවම් නොලැබුණු අය විය යුතුය.
c) කොරියානු ජනරජයෙන් ආපසු හරවා හෝ නෙරපා එවූ අය නොවිය යුතුය.
d) මෙරටින් බැහැරවීම් තහනම් කර ඇති අයෙකු නොවිය යුතුය.
e) වර්ණ අන්ධ හෝ වර්ණ දුර්වලකම් නොමැති අය විය යුතුය.
කොදුඇට පෙල ආබාධ සහිත හෝ ඇඟිලි අඩු හෝ ඉවත් කර ඇති පුද්ගලයින්ට විභාගයට පෙනී සිටීමට අවස්ථාව හිමිවන නමුත් ඔවුන් විභාගය සමත් නොකරනු ඇත.
f) **E-9 වීසා කාණ්ඩය සහ E-10 වීසා කාණ්ඩය යන වීසා කාණ්ඩ දෙක යටතේම වූ සේවා කාලයද ඇතුළුව වසර 05කට වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති තැනැත්තන් විය යුතු ය.**

**4.EPS-TOPIK විභාගය සඳහා අයදුම් කිරීම.**

- **අයදුම්පත් නිකුත් කිරීමේ කාලසීමාව :** 2023 පෙබරවාරි මස 13 සිට 2023 පෙබරවාරි මස 22 දක්වා **(ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ලබාගැනීම සඳහා ලියාපදිංචි විය හැකිය.)**

**a) අවශ්‍ය ලේඛණ-**

- **1 . අයදුම්පත්‍රය (ලියාපදිංචියේදී ලබා දෙනු ඇත.)**

❖ සෑම අයදුම්පත්‍රයකම අයදුම්පත් අංකය මුද්‍රණය කර ඇත. එක් අයදුම්කරුවෙකුට එක් අයදුම්පතක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකිය.

❖ නිපුණතා පරීක්ෂණය සඳහා පෙනි සිටිමට අවශ්‍ය වන අයදුම්කරුවන් ඒ සඳහා අවශ්‍ය වන අයදුම්පත්‍රය මේ සමඟ ඇමුණුම -03 ලෙස දක්වා ඇත. එම අයදුම්පත්‍රය සමග ලියාපදිංචියේදී අදාළ සහතික සමඟ අයදුම්පත්‍රය භාර දිය යුතුවේ.

- **2. විදේශ ගමන් බලපත්‍රයේ පිටපත**

- **ඉදිරියට මාස 03 ක වලංගු කාලය සහිත ,විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපය සහිත පිටුවෙහි ස්කෑන් පිටපතක්**

- 100kb යටත්ව, ප්‍රමාණය (600 Pixels. Jpg විය යුතුය)

- විදේශ ගමන් බලපත්‍ර යේ සඳහන් නමට වෙනස් ආකාරයේ නමක් අයදුම්පත්‍රය ලබාගැනීමේදී ඇතුළත් නොකල යුතුය.

- අයදුම්කරුවන්ගේ පෞද්ගලික තොරතුරුවල යම් වෙනසක් සිදුවී තිබේ නම් ඒ සඳහා සම්පූර්ණ වගකීම අයදුම්කරු විසින් භාරගත යුතුවේ. එම නිසා විභාග අයදුම්පත් ලබා ගැනීමට ලියාපදිංචි වීමේදී වලංගු විදේශ ගමන් බලපත්‍රයක් තිබීම අනිවාර්යය වේ.

- අයදුම්කරුවන් විසින් අයදුම්පත ලබාගැනීම සඳහා ඇතුලත් කරනු ලබන පෞද්ගලික තොරතුරු (නම,උපන් දිනය,විදේශ ගමන් බලපත්‍ර අංකය, ස්ත්‍රී/පුරුෂ භාවය ) සහ ඡායාරූපය ඔවුන්ගේ ඉදිරි
- කොරියානු රැකියා සඳහා භාවිතා කරනු ලබයි.එම නිසා එම තොරතුරු කිසිම අවස්ථාවක වෙනස් කළ නොහැක.

**3. වර්ණ ඡායාරූප ප්‍රමාණය- සෙ.මී.3.5 X4.5 (මාස 03ක් ඇතුළත ලබාගත් සුදු පැහැති පසුබිම සහිත විය යුතුය)**

- ඡායාරූපය **15 Kb** යටත් විය යුතු අතර එහි ප්‍රමාණය **(100~300 Pixels. Jpg** ආකෘතියෙන් තිබිය යුතුය.**)**

- යම් අපේක්ෂකයකු විදේශ ගමන් බලපත්‍ර මඟින් විභාගයේදී හඳුනාගත නොහැකි නම් විභාගයට පෙනී සිටිමට අවසර දෙනු නොලැබේ.

- **සැ.යු - විභාගයට පෙනි සිටිමේදී පුද්ගලයන් ලබාදුන් ඡායාරූපයත්, විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපයත් අතර කිසිදු වෙනසක් නොතිබිය යුතුය)**

- 04. **විභාග අයදුම්පත් ගාස්තුව**

❖ ඇමරිකානු ඩොලර් 28 ( රු. - **10,140/- )**

**නොවැළැක්විය හැකි හේතුවක් මත ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් අයදුම්කරුවන්ට ලියාපදිංචි කාලසීමාව තුළ විභාග අයදුම්පත් ගාස්තුවෙහි මුළු මුදල ආපසු ලබාගත හැක.(නමුත් එක් වරක් අවලංගු කළහොත් නැවත අයදුම්පත්‍රයක් අනුමත නොකෙරේ.)**

05. **පළමු වටයේ විභාග මධ්‍යස්ථාන පිළිබඳව දැනුම්දීම සහ වේලාව:**

- නිවේදනය කරනු ලබන දිනය: **2023 මාර්තු 06**

- **නිවේදනය කරනු ලබන ක්‍රමය : 1.** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය (www.slbfe.lk)

2. http://epstopik.hrdkorea.or.kr

06. **පළමු වටයේ සැකැස්ම**

**a.** විභාග දිනය:

**- (නිෂ්පාදන-පළමු වටය) මාර්තු 13 ~ මැයි 30,2023**

**- (නිෂ්පාදන-දෙවන වටය) ජුනි 01 ~ අගෝස්තු 30,2023**

- (ධීවර) සැප්තැම්බර් 01 ~ නොවැම්බර් 30 ,2023

( විභාගය සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන්ගේ ප්‍රමාණය අනුව විභාග දින වෙනස් විය හැක. එක් එක් අයදුම්කරුවන්ගේ විභාග දින දැනගැනීම පිණිස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියට (www.slbfe.lk) වෙත පිවිසෙන්න.)

b. **විභාග මධ්‍යස්ථානය -** පරිගණක ආශ්‍රිත විභාග මධ්‍යස්ථානය, අංක 205,දෙපානම,පන්නිපිටිය

c. විභාග කාල පරිච්ඡේදය

| විභාග කොටස | අයදුම්කරුවන් සඳහා පූර්ව අවබෝධය ලබාදීම | කාල පරිච්ඡේදය | |
|---|---|---|---|
| | | **කියවීම( මිනිත්තු 25)** | **සවන්දීම (මිනිත්තු 25)** |
| පළමු සැසිය | 09:30~10:00 | 10:00~10:25 | 10:25~10:50 |
| දෙවන සැසිය | 11:00~11:30 | 11:30~11:55 | 11:55~12:20 |
| තුන්වන සැසිය | 13:30~14:00 | 14:00~14:25 | 14:25~14:50 |
| හතරවන සැසිය | 15:00~15:30 | 15:30~15:55 | 15:55~16:20 |

- ❖ විභාග අපේක්ෂකයින් සිය සැසිය සඳහා පැමිණීමේදී පූර්ව අවබෝධය ලබාදෙන ස්ථානයේ පෙ.ව.9.30, පෙ.ව.11.00,ප.ව.13.30 සහ ප.ව.15.00 වන විට පැමිණ අසුන්ගෙන සිටිය යුතුය.

**7. පළමු වටයේ පිළිවෙළ-**

| කොටස | ප්‍රශ්න සංඛ්‍යාව | මුළු ලකුණු | කාලය |
|---|---|---|---|
| කියවීම | 20 | (නිෂ්පාදන) ලකුණු 100<br>(ධීවර) ලකුණු 90 | මිනිත්තු 25 |
| සවන්දීම | 20 | | මිනිත්තු 25 |
| එකතුව | **40** | **ලකුණු 100 හෝ ලකුණු 90** | මිනිත්තු 50 |

- **(විභාග සැකැස්ම)** 01. බහුවිධ පිළිතුරු මඟින්, 02. කියවීම සහ සවන්දීම විරාමයකින් තොරව පරීක්ෂා කරනු ලැබේ.

**b.) පරීක්ෂණය සඳහා අවශ්‍ය දෑ**

- විභාග ප්‍රවේශ පත්‍රය
- වලංගු විදේශ ගමන් බලපත්‍රය

1. සෑම අයදුම්කරුවෙකුම වලංගු විදේශ ගමන් බලපත්‍රය රැගෙන ආ යුතු අතර විභාග අයදුම්පත් ඉල්ලුම් කිරීමේදී ඇතුළත් කරනු ලබන ගමන් බලපත්‍රයම විභාග මධ්‍යස්ථානයට රැගෙන ආ යුතුය.

2. විදේශ ගමන් බලපත්‍රය රැගෙන නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණයට සහභාගී වීමට අවසර නොලැබේ.

**8. ප්‍රථම පරීක්ෂණ වටයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම.**

**ප්‍රතිඵල නිවේදනය කිරිමේ දිනය-**

**- (නිෂ්පාදන-පළමු වටය) ජුනි 05, 2023**

**- (නිෂ්පාදන-දෙවන වටය) සැප්තැම්බර් 05 ,2023**

**- (ධීවර) දෙසැම්බර් 05 ,2023**

**ප්‍රතිඵල නිවේදනය කිරිමේ ක්‍රමය-**

01. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය -www.slbfe.lk
02. http://epstopik.hrdkorea.or.kr
03. http://www.eps.go.kr

- එක් එක් අපේක්ෂයාගේ ප්‍රතිඵල නිවේදනය කිරිම. -http://www.eps.go.kr

**II. දෙවන වටයේ පරීක්ෂණ ( කුසලතා සහ නිපුණතා පරීක්ෂණය)**

- ප්‍රථම වටයේ විභාගය සමත් අය අතුරින් යමෙකුට තමා තෝරාගත් කර්මාන්ත ක්ෂේත්‍රයේ පළපුරුද්ද තිබේ නම් ,ඊට අදාළ ක්ෂේත්‍රවල පුහුණුවක් ලබා සහතිකයක් තිබේ නම් හෝ ජාතික වෘත්තිය සහතික තිබේ නම් මෙම නිපුණතා පරීක්ෂණයට පෙනී සිටිය හැකිය.

- ප්‍රථම වටයේ පරීක්ෂණය සමත් අය අනිවාර්යෙන්ම කුසලතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අතර නිපුණතා පරීක්ෂණය අවශ්‍ය නම් ඒ සඳහා ලේඛණ මුල්ම ලියාපදිංචියේදී ලබාදිය යුතුවේ.

- කුසලතා පරීක්ෂණයට සහභාගි නොවන අයට ඇඟයුම් ලකුණු ක්‍රමවේදය තුළ පරීක්ෂණය සමත්වීම සඳහා සුදුසුකම් නොලබයි.

- **අයදුම්පත් භාරගැනීමේ කාලපරිච්ඡේදය-**

**- (නිෂ්පාදන-පළමු වටය) - 2023 ජුනි 19 සිට ජුනි 22 දක්වා**

**- (නිෂ්පාදන-දෙවන වටය) -2023 සැප්තැම්බර් 18 සිට සැප්තැම්බර් 21 දක්වා**

**- (ධීවර) 2023 දෙසැම්බර් 11 සිට දෙසැම්බර් 13 දක්වා**

- **අයදුම්පත් භාරගන්නා ස්ථානය -** කොරියානු භාෂා ප්‍රතිඵල නිවේදනය සමඟ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියේ පල කරනු ලැබේ.( www.slbfe.lk)
- **අයදුම්පත් භාරගන්නා ක්‍රමය -** පුද්ගලයාම පැමිණ භාරදිය යුතුය.
- **අවශ්‍ය වන ලේඛණ සහ අවශ්‍යතා :**

01. විදේශ ගමන් බලපත්‍රය සහ විභාග ප්‍රවේශ පත්‍රය සිය ඡායාරූපය අලවා ඇති කුඩා කොටස
02. නිපුණතා පරීක්ෂණය සඳහා වන අයදුම්කරුවන් විසින් පුරවන ලද පෝරමය
03. නිපුණතා පරීක්ෂණය සඳහා වෙනත් සාක්ෂි සඳහා ලේඛණ

| | භාරදිය යුතු ලේඛණ | තොරතුරු | වෙනත් තොරතුරු |
|---|---|---|---|
| සේවා පළපුරුද්ද | වෘත්තීය පලපුරුද්ද සඳහා සහතික(මුල් පිටපත) | සේවා කරන ලද ආයතන වලින් ලබාගත් සේවා සහතික ඉදිරිපත් කළ හැකිය.<br>කොරියානු රටෙහි සමාගමක සේවය කර ඇත්නම් එම සේවා සහතිකයේ පිටපතක් EPS ගිණුම හරහා ලබාගත හැකිය. | |
| පුහුණු පාඨමාලා සම්පූර්ණ කිරීම/අධ්‍යාපනික පසුබිම | පුහුණු පාඨමාලා සහතික (මුල් පිටපත) | පුහුණු පාඨමාලා සම්පූර්ණ කළ බවට ලබාදෙන රජයේ හෝ පෞද්ගලික අංශයේ සහතික ඉදිරිපත් කළ හැක. (විදේශීය පාඨමාලා ඇතුළුව) | **(සහතිකයේ පිටපතක් හා මුල් ලේඛනය මෙම පරීක්ෂණ දිනයේදී කුසලතා පරීක්ෂණයට රැගෙන ආ යුතුය)** |
| | අධ්‍යාපනික පසුබිම (මුල් පිටපත) | උපාධි සහතිකය ඉදිරිපත් කළ හැකිය | **(සහතිකයේ පිටපතක් හා මුල් ලේඛනය මෙම පරීක්ෂණ දිනයේදී කුසලතා පරීක්ෂණයට රැගෙන ආ යුතුය)** |
| ජාතික සහතික | ජාතික සහතිකයේ පිටපතක් හෝ තහවුරු කිරීමේ ලියවිල්ලේ මුල් පිටපත | ජාතික මට්ටමේ සහතික පමණක් මෙහිදී ඉදිරිපත් කළ යුතු අතර ඒවා ජාතික මට්ටමේ තොරතුරු වල තිබිය යුතුය. | විදෙස් සහතික අදාළ නොවේ.<br>**(සහතිකයේ පිටපතක් හා මුල් ලේඛනය මෙම පරීක්ෂණ දිනයේදී කුසලතා පරීක්ෂණයට රැගෙන ආ යුතුය)** |

- කොරියාවේ රැකියා පලපුරුද්ද ද මේ සඳහා අදාළ වේ.
- කොරියානු සේවා පලපුරුද්ද සම්බන්ධයෙන් සේවා සහතිකය EPS මුල් පිටුව මඟින් භාගත කළ හැකිය.(www.eps.go.kr)
- පුහුණු සහතික වල පාඨමාලාවේ නම,පැය ගණන සහ අන්තර්ගතය සඳහන් විය යුතුය.
- ඩිප්ලෝමාවන්හි ශාස්ත්‍රාලීය නාමය ලියා තිබිය යුතුය.
- මෙම නිපුණතා පරීක්ෂණයට භාරදෙන ලේඛණවල හෝ සහතිකවල යම් සාවද්‍ය බවක් ව්‍යාජ බවක් අනාවරණය වුවහොත් එම අපේක්ෂකයාගේ විභාග ප්‍රතිඵල සම්පූර්ණයෙන් අවලංගු කරන අතර නැවත EPS පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමටද වසර 04 කට තහනම් කරනු ලැබේ.

**අවසර නැති රැකියා පලපුරුද්ද,පුහුණු පාඨමාලා සහ ජාතික සහතික සඳහා උදාහරණ-**

**රැකියා පළපුරුද්ද-**

අයදුම්කල කර්මාන්ත ක්ෂේත්‍රය තුළද අතීතයේ වැඩකර ඇති බවට අයදුම්කරුට සාක්ෂි තිබුණද එම පලපුරුද්ද අදාළ නොවන විට ඒ සඳහා අවසර නොලැබේ. අලෙවිය පිළිබඳව මානව සම්පත් පිළිබඳ,ගිණුම් ක්ෂේත්‍රය ,අධ්‍යාපනය,මහජනතාවය(තාක්ෂණ වේදීන් නොවන),ගෑස් මධ්‍යස්ථාන,සූප ශාස්ත්‍ර,සේවා,කොණ්ඩා කැපීම් යනාදිය පිළිගන්නේ නැත.

අයදුම්කළ ක්ෂේත්‍රයේ උපදේශකයින් ලෙස පෙර වැඩකළ අත්දැකීම් පිළිබඳ ලේඛණ ඇත්නම් එම ලේඛණ ඉදිරිපත් කළ හැක.උදා:ලෙස එකලස් කිරීම සැකසීම සම්බන්ධයෙන් උපදේශකයින් ලෙස සුදුසුකම් ලබා ඇත්නම් ඒවා නිෂ්පාදන අංශයේ පලපුරුද්ද සඳහා භාවිතා කළ හැක.

**පුහුණු පාඨමාලා -**ඉල්ලුම් කළ ක්ෂේත්‍රයට නොගැළපෙන පුහුණුවීම් සඳහා වන සහතික පිළිනොගනී. උදාහරණ ලෙස හෙද සේවා පුහුණු, ගිණුම්, නායකත්ව පුහුණුව ආදිය මේ සඳහා පිළිගන්නේ නැත.

**ජාතික සහතික-**අයදුම්කරු ඉල්ලුම් කරන ක්ෂේත්‍රයට අදාළ නොවන ජාතික සහතික ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

උදා - රියදුරු බලපත්‍ර, භාෂා පුහුණු සහතික, වෘත්තීමය බලපත්‍ර (වෛද්‍ය, .......නීති) සහතික පිළිනොගනී.

**අධ්‍යාපනික පසුබිම -** නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා පමණක් අදාළ වන අතර තෝරාගත් ක්ෂේත්‍රයට අදාළ විය යුතුය. නීත්‍යානුකූල වශයෙන් අනුමත කරන ලද උසස් අධ්‍යාපනික ආයතනය, විශ්වවිද්‍යාල වෙතින් නිකුත් කරන ලද අධ්‍යාපනික සුදුසුකම් සලකා බැලේ.

උදා-වෛද්‍ය පීඨය, හෙද,ගණකාධිකාරි සහ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ නොවන සහතික පිළිගනු නොලැබේ.

**පරීක්ෂණ ගාස්තු-** ගාස්තුවක් අය නොකෙරේ.

02. පරීක්ෂණය පවත්වන දිනය හා ස්ථානය නිවේදනය

**- (නිෂ්පාදන-පළමු වටය) - 2023 ජූනි 03**

**- (නිෂ්පාදන-දෙවන වටය) -2023 ඔක්තෝම්බර් 02**

**- (ධීවර) 2023 දෙසැම්බර් 18**

**ප්‍රතිඵල නිවේදනය කිරීම- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය (www.slbfe.lk)**

**03. කුසලතා පරීක්ෂණය පැවැත්වීම**

- කුසලතා ක්ෂේත්‍රයේ උප කොටස් සහ ලකුණු ව්‍යාප්තිය

| කර්මාන්තය (කුසලතා පරීක්ෂණය) | මුළු ලකුණු | කුසලතා පරීක්ෂණ | | |
|---|---|---|---|---|
| | | කායික ශක්තිය | සම්මුඛ පරීක්ෂණය | මූලික කුසලතා |
| නිෂ්පාදන | 100 | 30 | 30 | 40 |
| ධීවර | 110 | 30 | 30 | 50 |

පරීක්ෂණය පවත්වන දිනයන්

**- (නිෂ්පාදන-පළමු වටය) - 2023 ජුලි 10 සිට 2023 ජුලි 24**

**- (නිෂ්පාදන-දෙවන වටය) -2023 ඔක්තෝම්බර් 10 සිට ඔක්තෝම්බර් 23 දක්වා**

**- (ධීවර) 2023 දෙසැම්බර් 21 සිට දෙසැම්බර් 29 දක්වා**

පරීක්ෂණ කාලරාමුව

| සැසිය | දැනුවත් කිරීම (මිනිත්තු 30) | කාලපරිච්ඡේදය (පැය 03) | ලකුණු ලබාදීම |
|---|---|---|---|
| පළමු සැසිය | 08.30 – 09.00 | 09.00 – 12.00 | 12.00 – 12.30 |
| දෙවන සැසිය | 12.30- 13.00 | **13.00** – 16.00 | 16.00- 17.00 |

අපේක්ෂකයින් හට තමන්ට ලැබුණු කාලරාමුව වෙනස්කළ නොහැක. දෙන ලද කාලයෙන් පසුව පැමිණෙන අය පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබයි.( පෙ.ව.8.30 සිට ප.ව.12.30 දක්වා)

- නිපුණතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ ලේඛණ සහ සහතික මෙම කුසලතා පරීක්ෂණයේ දී පවත්වන සම්මුඛ පරීක්ෂණයේ දී නැවත සනාථ කරගනු ලැබේ. එම අවස්ථාවේ දී යම් ලේඛණයක් හෝ සහතිකයක් ව්‍යාජ බවට අනාවරණය වුවත්, අයදුම්කරුගේ ප්‍රතිඵල තහනම් වන අතර, නැවත EPS ක්‍රමයට ඇතුල්වීම වසර 04 කට තහනම් කරයි. (අයදුම්කරු බලධාරින් වෙත ඉදිරිපත් කරනු ලැබේ)

**III. ප්‍රතිඵල නිවේදනය කිරීම**

**තෝරාගැනීමේ ක්‍රමවේදය-**

**පලමු වටයේ සහ දෙවන වටයේ ලබාගන්නා ලකුණු වල එකතුවෙන් අවසන් ප්‍රතිඵල නිවේදනය කරන අතර ලබාගන්නා ලකුණු වල ඉහළම මට්ටම අනුව කඩඉම් ලකුණ තීරණය වේ.**

පරීක්ෂණ ප්‍රතිඵල නිවේදනය කිරීම-

**- (නිෂ්පාදන-පළමු වටය) - 2023 අගෝස්තු 02**

**- (නිෂ්පාදන-දෙවන වටය) -2023 නොවැම්බර් 08**

**- (ධීවර) 2024 ජනවාරි 10**

- **නිවේදනය කරනු ලබන ක්‍රමවේදය**
  01. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය -www.slbfe.lk
  01. http://www.eps.go.kr
  02. http://epstopik.hrdkorea.or.kr

- **එක් එක් අපේක්ෂයාගේ ප්‍රතිඵල නිවේදනය කිරිම.** -http://www.eps.go.kr

ඇගයුම් මත ලකුණු දීමේ ක්‍රමය මඟින් පවත්වන පරීක්ෂණයේ ප්‍රතිඵල වල වලංගු භාවය- නිවේදනය කළ දින සිට වසර දෙකක් දක්වා වලංගු වේ.

## IV. දැනගත යුතු වෙනත් කරුණු -

**01.** වර්ණ අන්ධතාවය හෝ වර්ණ දුර්වලතා ඇති අයඳුම්කරුවන් විභාගයෙන් සමත් නොකෙරේ. එසේම කොඳුඇට පෙළේ ආබාධයක් හෝ ඇඟිලි ආබාධ ඇති අයට **EPS-TOPIK** විභාගයට පෙනී සිටිමට අවස්ථාව නොමැත.

02. පරීක්ෂණ අවස්ථාවල කිසිදු සන්නිවේදන උපකරණයක්,විද්‍යුත් උපකරණ පාවිච්චි කිරිම සම්පූර්ණ තහනම් වේ. දුරකථන,ලැප්ටොප්,ටැබ්ලට්,විද්‍යුත් සටහන් පොත් ආදී කිසිවක් ළඟ තබාගත නොහැක.
මේවා ළඟ තබාගැනීම මඟින් විභාග වංචා සිදුකිරිමට උත්සහා කළ බවට චෝදනා එල්ල වේ.

03. විභාග මධ්‍යස්ථාන තුළ වංකව හා වංචාකාරි අයුරින් හැසිරීම,මඟින් විභාග ඒකාග්‍රතාවය බිදීමට කටයුතු කළහොත් වසර හතරක (04) විභාග තහනමක් පනවනු ලැබේ.

නිපුණතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලේඛණ අවස්ථා 03කදී පරීක්ෂාවට භාජනය කරනු ලැබේ.එම ලේඛණ අසත්‍ය බව අනාවරණය වුවහොත් **වසර හතරක** විභාග තහනමක් අයඳුම්කරුට ලැබේ.

04. අයඳුම්පත්‍රයේ හා ගමන් බලපත්‍රයේ තොරතුර පරස්පර වීමෙන් අයඳුම්කරුට මෙම ඇඟයුම් ලකුණු ක්‍රමයට ඉදිරිපත්වීම අවස්ථාව නොලැබී යයි. වෘත්තීය සඳහා වන සහතික සහ රැකියාව සහතික කිරිම සඳහා ඉදිරිපත් කරන ලේඛණවල ඇතුළත් කිසිදු තොරතුරක් විකෘති කිරීමට, මැකීමට, අත්සන් ව්‍යාජ ලෙස යෙදීම සිදු නොකළ යුතුය. එවැනි වෙනස්කම් සිදුකර තිබෙන අයඳුම්කරුවන්ගේ වලංගු භාවය අහෝසි කරනු ලැබේ.

**කෝවිඩ්-19 පැතිරයාම වැළැක්වීම පිළිබඳ නිවේදනය**

- විභාගය සඳහා පැමිණෙන සියළුම අයඳුම්කරුවන් විභාග මධ්‍යස්ථානයට පැමිණීමේදී මුඛ ආවරණ පැළදීම අනිවාර්යයවෙන අතර කෝවිඩ්-19 වසංගත තත්ත්වයෙන් ආරක්ෂා වීම සඳහා අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරිම සිදු කළ යුතුය.
- විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීමට පෙර සියළුම අයඳුම්කරුවන්ගේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කරනු ලබන අතර, සියළු දෙනාම සනීපාරක්ෂක ද්‍රව්‍ය යොදා තම දෑත් පිරිසිදු කරගත යුතුය. යම් අයඳුම්කරුවෙකුට උණ,කැස්ස හෝ වෙනත් ශ්වසන රෝගයකින් පෙළෙන්නේ නම් විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීමට ඉඩ ලබාදෙනු නොලැබේ.
- වැළඳගැනීම්,අතට අතදීම වැනි ශාරිරක සබඳතා වලින් වැළකී, කැස්ස වැනි රෝගයන්ගේ හැකිතාක් ආරක්ෂා වී සිටිමට ඔබ වගබලා ගත යුතුය. (කැස්ස සහ කිවිසුම් යාම)

## <ප්‍රවේශපත්‍ර අයදුම්කරුවන්ගේ විශේෂ අවධානය (පූර්වාරක්ෂාව) සඳහා >

- විභාගය සමත් වූ තැනැත්තෙකු වෙබ් අඩවියට ඇතුළු වීමට ( Valid Roster ) අවස්ථාව සලසා ගන්නා නමුදු නිශ්චිත වශයෙන් රැකියා අවස්ථාවක් ලබාගැනීමට අනිවාර්ය හිමිකමක් නොලබයි.

- එසේම කිසියම් තැනැත්තෙකු වෛද්‍ය පරීක්ෂණය අසමත් වුවහොත් හෝ නීත්‍යානුකූල නොවන පරිදි කොරියානු රාජ්‍යයෙහි රැඳී සිටි බවට වාර්තා ඇත්නම් මෙම රැකියා ලැබීමේ අවස්ථා අහිමි වේ.

- එසේම කොරියාවට ඇතුළුවීමෙන් පසුව පවත්වනු ලබන මත්ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණයෙන් කිසියම් තැනැත්තෙකු අසමත් වුවහොත් එම තැනැත්තා ආපසු තම රටට හරහා යවනු ලැබේ.

- කිසියම් තැනැත්තෙක් E-9 සහ E-10 වීසා කාණ්ඩය යටතේ මුළු එකතුව වශයෙන් වසර 05ක් ඉක්මවා දකුණු කොරියානු රටෙහි සේවය කර ඇත්නම් එවැනි තැනැත්තන් මෙම පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

◈ ලබාගත යුතු ලකුණු ප්‍රමාණය

- **EPS-TOPIK** පරීක්ෂණය
  - **(නිෂ්පාදන)** ලකුණු 100 න් ලකුණු **55**
  - **(ධීවර)** ලකුණු 90න් ලකුණු 36
- කුසලතා පරීක්ෂණය
  - **(නිෂ්පාදන)** ලකුණු 100 න් ලකුණු 60
  - **(ධීවර)** ලකුණු 110 න් ලකුණු 66

◈ සේවා පලපුරුද්ද, පුහුණු සහතික සහ පුහුණු පාඨමාලා සඳහා අමතර ලකුණු ලබාදේ.

(නිෂ්පාදන අංශය සඳහා )

◈ නිපුණතා පරීක්ෂණයට ඉදිරිපත් විය යුත්තේ අදාළ සහතික තිබේ නම් පමණි.

◈ විභාග වංචා සිදු කරන අයදුම්කරුවන් සඳහා දඬුවම්දීම බලාත්මක කර ඇත.තවද,එවැනි වංචා සිදු කරන්නන්ට ඉදිරි වසර 04 ක විභාග තහනමක් පැනවේ.අයුතු ලෙස කොරියාවේ සේවය සඳහා පැමිණියහොත් ඔහු හෝ ඇය නීතියෙන් වරදකරුවෙකු වෙනු ඇත.

【Attachment-1】

# ක්ෂේත්‍රය අනුව ලකුණු ලබාදීමේ විස්තරය

| කර්මාන්තය | | | මුළු ලකුණු | නිපුණතා පරීක්ෂණය | | |
|---|---|---|---|---|---|---|
| | EPS-TOPIK | කුසලතා පරීක්ෂණය | | වෘත්තීය | සහතික | පුහුණු සහතික/අධ්‍යාපනික පසුබිම |
| නිෂ්පාදන | 100 | 100 | 200 | 3 | 1 | 1 |
| ධීවර | 90 | 110 | 200 | 3 | 1 | 1 |

| කර්මාන්තය | පලමු පරීක්ෂණය | දෙවන පරීක්ෂණය | | | | |
|---|---|---|---|---|---|---|
| | EPS-TOPIK | මුළු ලකුණු | කුසලතා පරීක්ෂණය | නිපුණතා පරීක්ෂණය | | |
| | | | | වෘත්තීය | සහතික | පුහුණු සහතික/අධ්‍යාපනික පසුබිම |
| Fishery (Special case) | 200 | 200 | 110 | 20 | 20 | 50 |

(ඇමුණුම-02)

**කුසලතා පරීක්ෂණයේ ආකෘතිය**

| කර්මාන්තය | කාණ්ඩය | කාර්යය | අන්තර්ගතය |
|---|---|---|---|
| නිෂ්පාදන . | සැකසීම | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්ම ඇතුල් කරන්න. |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | | බොල්ට් සහ නට් එකට සවි කිරිම | දෙන ලද කාලය තුළදී අදාළ සටහන අනුව දෙයාකාරයකින් යුත් නට් සහ බෝල්ට් තද කිරිම |
| | මිනුම් | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්මට ඇතුල් කරන්න |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | | මිනුම් | දෙන ලද කාලය තුළ දිග සහ පරිමාව අනුව මැනීම |
| | එක් කිරිම | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්මට ඇතුල් කරන්න |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | | එක් කිරීම | දෙන ලද කාලය තුළ නියමිත ස්ථානයක සවි කර ඇති වස්තූන් දෙකක් සපයනු ලබන උපකරණ මඟින් එකට සම්බන්ධ කිරිම. |
| ධීවර | පොදු | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්මට ඇතුල් කරන්න |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | මුහුදු වගාව | විල්බැරෝව ධාවනය | ලබාදෙනු ලබන කාලය ඇතුළත විල්බැරෝව ධාවනය කිරීම. |
| | ගැඹුරු සහ නොගැඹුරු මුහුද ආශ්‍රිත ධීවර කර්මාන්තය | ලණු සකස් කිරීම හා ගැට ගැසීම | නියමිත කාලයක් තුළ දී ඇති සැලසුමට අනුව ලණු සංවිධානය කර ගැට ගැසීම. |

【Attachment 3】

# (Job experience, Training course completion, National certificate)

# Competency test relevant documents

| Application No. (For Sending Agency) | |
|---|---|

I myself will take any responsibilities for falsified documents (certificate of career, copy of certificate) in registering EPS-TOPIK

**※ If applicant's document is proven to be falsified, the test result will invalidated and the person will not be able to take any test for 4 years.**

**Applicants to fill in** * Mark the industry you're applying for(●)

| EPS-TOPIK registration no. | | | 0032021C50600000 |
|---|---|---|---|
| Manufacture | ·Assemble(○) ·Measures(○) ·Join(○) | A | ·Rebar(○) ·Carpentry(○) |
| Agriculture & Stockbreeding | ·Agriculture(○) ·Livestock(○) | Fishery | ·Sea Farming(○) ·In and off Shore Fishery(○) |
| Date of birth | . . . | Contact no. | |
| Registration date | 20 . . | Name | (signature) |

**Applicants to fill in** * Mark(●) your answer — **For sending agency**

☐ **Job experience** (Only for those who have job experience)

| One year or more | Less than 1 year |
|---|---|
| ○ | ○ |

| | |
|---|---|
| True | ○ |
| False | ○ |

☐ **Training hours** (Only for those who had training)

| Training | | Academic Background | |
|---|---|---|---|
| 120 hours or more | Less than 120 hours | College or more | Highschool or less |
| | | | |

| | |
|---|---|
| True | ○ |
| False | ○ |

☐ **Certificates** (for those who have certificates, no more than two)

| No. | Name of the certificate | Issued date | Institute/organization |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

| | |
|---|---|
| True | ○ |
| False | ○ |

| Sending agency | Name: | (signature) |
|---|---|---|
| Interviewer | Name : | (signature) |

* Period of total employment should be written in months.

** Certificate of training course should be verified first and total training hours should be stated.

*** Confirm the relevancy of the major specified in the certificate of graduation before writing.

**** Documents should be verified as authentic and total amount of certificates should be stated

(ඇමුණුම-03)

රැකියා පළපුරුද්ද, සම්පූර්ණ කරන ලද පුහුණු පාඨමාලා,ජාතික මට්ටමේ සහතික)

නිපුණතා පරීක්ෂණයට අදාළ ලිපි ලේඛණ

| අයදුම්පත් අංකය(විදේශගත කරන ඒජන්සියේ ප්‍රයෝජනය සඳහා) | |
|---|---|

EPS-TOPIK විභාගයට ලියාපදිංචි සහතිකවල ( වෘත්තීය සහතික/සහතිකපත්වල පිටපත්) අසත්‍ය පිටපත් තිබේනම් මා විසින් එහි වගකීම භාරගනිමි.

※.අයදුම් කරු විසින් ලබාදෙන සහතිකපත් ව්‍යාජ ලේඛණ බවට තහවුරු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු වන අතර වසර හතරක් සඳහා නැවත විභාගයකට පෙනී සිටීමට ද නොහැකි වේ.

අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය

* ඔබ විසින් තෝරාගත් අංශය සඳහන් කිරීම සඳහා (●)

| EPS-TOPIK ලියාපදිංචි අංකය | | | |
|---|---|---|---|
| නිෂ්පාදන | ·සැකසීම(○) ·මිණුම් ඩබු(○) ·එකතු කිරීම(○) | ඉදිකිරීම් | කම්බි බැඳීම(○) ·වඩු වැඩ(○) |
| කෘෂිකර්මසහසත්වපාලනය | ·කෘෂිකර්ම(○)· පශු සම්පත්(○) | ධීවර | · මුහුදු වගාව(○)·වෙරළ සහ වෙරළාශ්‍රිත නොගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය(○) |
| උපන් දිනය | . . . | දුරකථන අංකය | |
| ලියාපදිංචි දිනය | 20 . . | නම | ( අත්සන) |

අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය

*ඔබගේ පිළිතුර සටහන් කරන්න(●)

විදේශගත කරන ඒජන්සිය සඳහා

☐ රැකියා පලපුරුද්ද ( රැකියා පලපුරුද්ද ඇති අය සඳහා පමණි)

| වසරක් හෝ ඊට වැඩි | වසරකට අඩු |
|---|---|
| ○ | ○ |

| | |
|---|---|
| සත්‍ය | ○ |
| අසත්‍ය | ○ |

☐ පුහුණු සහ අධ්‍යාපනික පසුබිම කාලය -පැය ගණන ( පුහුණුව ලබා ඇති අය සඳහා පමණි)

| පුහුණුව | | අධ්‍යාපනික පසුබිම | |
|---|---|---|---|
| පැය 120 හෝ ඊට වැඩි | පැය 120 ට අඩු | විශ්ව විද්‍යාල උපාධිය සහ ඉන් ඉහළ | උසස් පාසලට හෝ පහළ |
| ○ | ○ | ○ | ○ |

| | |
|---|---|
| සත්‍ය | ○ |
| අසත්‍ය | ○ |

☐ සහතික ( සහතිකපත් ඇති අය සඳහා, සහතිකපත් දෙකකට වඩා නොවැඩි )

| අංකය | සහතිකයේ නම | නිකුත්කළ දිනය | ආයතනය/සංවිධානය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

| | |
|---|---|
| සත්‍ය | ○ |
| අසත්‍ය | ○ |

විදේශගත කරන ඒජන්සිය නම: ( අත්සන)

සම්මුඛ පරීක්ෂක නම: ( අත්සන)

* මුළු සේවා කාලය මාස වලින් සටහන් කළ යුතුය.

** පුහුණු පාඨමාලා සහතික පළමුව තහවුරු සහතික කළ යුතු අතර මුළු පුහුණු කාලය පැය ගණනින් සටහන් විය යුතුය.

*** අධ්‍යාපනික සහතිකය තෝරාගත් ක්ෂේත්‍රයට අදාළ විය යුතුය.

**** අව්‍යාජ ලෙස ලියකියවිලි සත්‍යාපනය කළ යුතු අතර මුළු සහතික ප්‍රමාණය ඉදිරිපත් කල යුතුය.

【Attachment-1】

# ක්ෂේත්‍රය අනුව ලකුණු ලබාදීමේ විස්තරය

| කර්මාන්තය | | | මුළු ලකුණු | නිපුණතා පරීක්ෂණය | | |
|---|---|---|---|---|---|---|
| | EPS-TOPIK | කුසලතා පරීක්ෂණය | | වෘත්තීය | සහතික | පුහුණු සහතික/අධ්‍යාපනික පසුබිම |
| නිෂ්පාදන | 100 | 100 | 200 | 3 | 1 | 1 |
| ධීවර | 90 | 110 | 200 | 3 | 1 | 1 |

| කර්මාන්තය | පලමු පරීක්ෂණය | දෙවන පරීක්ෂණය | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | නිපුණතා පරීක්ෂණය | | |
| | EPS-TOPIK | මුළු ලකුණු | කුසලතා පරීක්ෂණය | වෘත්තීය | සහතික | පුහුණු සහතික/අධ්‍යාපනික පසුබිම |
| Fishery (Special case) | 200 | 200 | 110 | 20 | 20 | 50 |

**කුසලතා පරීක්ෂණයේ ආකෘතිය**

| කර්මාන්තය | කාණ්ඩය | කාර්යය | අන්තර්ගතය |
|---|---|---|---|
| නිෂ්පාදන<br>. | සැකසීම | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්ම ඇතුල් කරන්න. |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | | බොල්ට් සහ නට් එකට සවි කිරිම | දෙන ලද කාලය තුළදී අදාළ සටහන අනුව දෙයාකාරයකින් යුත් නට් සහ බෝල්ට් තද කිරිම |
| | මිනුම් | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්මට ඇතුල් කරන්න |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | | මිනුම් | දෙන ලද කාලය තුළ දිග සහ පරිමාව අනුව මැනීම |
| | එක් කිරිම | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්මට ඇතුල් කරන්න |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | | එක් කිරීම | දෙන ලද කාලය තුළ නියමිත ස්ථානයක සවි කර ඇති වස්තූන් දෙකක් සපයනු ලබන උපකරණ මඟින් එකට සම්බන්ධ කිරිම. |
| ධීවර | පොදු | පින් ඇතුල් කිරිම | රූප සටහන අනුව වර්ණය සහ ප්‍රමාණය සහ හැඩය අනුව අදාළ සැකැස්මට ඇතුල් කරන්න |
| | | අයිතම එල්ලීම | වළලු ප්‍රමාණය අනුව අදාළ දණ්ඩේ එල්ලීම |
| | මුහුදු වගාව | විල්බැරෝව ධාවනය | ලබාදෙනු ලබන කාලය ඇතුළත විල්බැරෝව ධාවනය කිරීම. |
| | ගැඹුරු සහ නොගැඹුරු මුහුද ආශ්‍රිත ධීවර කර්මාන්තය | Rope grooming and knotting | Organize and knot the rope according to the drawing within the time limit |

【Attachment 3】

## (Job experience, Training course completion, National certificate)

# Competency test relevant documents

| Application No. (For Sending Agency) | |
|---|---|

I myself will take any responsibilities for falsified documents (certificate of career, copy of certificate) in registering EPS-TOPIK

**※ If applicant's document is proven to be falsified, the test result will invalidated and the person will not be able to take any test for 4 years.**

**Applicants to fill in** — * Mark the industry you're applying for(●)

| EPS-TOPIK registration no. | | 0032021C50600000 | |
|---|---|---|---|
| Manufacture | ·Assemble(○) ·Measures(○) ·Join(○) | A | ·Rebar(○) ·Carpentry(○) |
| Agriculture & Stockbreeding | ·Agriculture(○) ·Livestock(○) | Fishery | ·Sea Farming(○) ·In and off Shore Fishery(○) |
| Date of birth | . . . | Contact no. | |
| Registration date | 20 . . | Name | (signature) |

**Applicants to fill in** — * Mark(●) your answer — **For sending agency**

☐ **Job experience** (Only for those who have job experience)

| One year or more | Less than 1 year |
|---|---|
| ○ | ○ |

| | |
|---|---|
| True | ○ |
| False | ○ |

☐ **Training hours** (Only for those who had training)

| Training | | Academic Background | |
|---|---|---|---|
| 120 hours or more | Less than 120 hours | College or more | Highschool or less |
| | | | |

| | |
|---|---|
| True | ○ |
| False | ○ |

☐ **Certificates** (for those who have certificates, no more than two)

| No. | Name of the certificate | Issued date | Institute/organization |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

| | |
|---|---|
| True | ○ |
| False | ○ |

| Sending agency | Name: | (signature) |
|---|---|---|
| Interviewer | Name : | (signature) |

* Period of total employment should be written in months.

** Certificate of training course should be verified first and total training hours should be stated.

*** Confirm the relevancy of the major specified in the certificate of graduation before writing.

**** Documents should be verified as authentic and total amount of certificates should be stated

(ඇමුණුම-03)

රැකියා පළපුරුද්ද, සම්පූර්ණ කරන ලද පුහුණු පාඨමාලා,ජාතික මට්ටමේ සහතික)

නිපුණතා පරීක්ෂණයට අදාළ ලිපි ලේඛණ

| | |
|---|---|
| අයදුම්පත් අංකය(විදේශගත කරන ඒජන්සියේ ප්‍රයෝජනය සඳහා) | |

EPS-TOPIK විභාගයට ලියාපදිංචි සහතිකවල ( වෘත්තීය සහතික/සහතිකපත්වල පිටපත්) අසත්‍ය පිටපත් තිබෙනම් මා විසින් එහි වගකීම භාරගනිමි.

※.අයදුම් කරු විසින් ලබාදෙන සහතිකපත් ව්‍යාජ ලේඛණ බවට තහවුරු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු වන අතර වසර තුනක් සඳහා නැවත විභාගයකට පෙනී සිටීමට ද නොහැකි වේ.

**අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය**

* ඔබ විසින් තෝරාගත් අංශය සඳහන් කිරීම සඳහා (●)

| EPS-TOPIK ලියාපදිංචි අංකය | | | |
|---|---|---|---|
| නිෂ්පාදන | ·සැකසීම(○) ·මිණුම් ඬු(○) ·එකතු කිරීම(○) | ඉදිකිරීම | කම්බිබැඳීම(○) ·වඩු වැඩ(○) |
| කෘෂිකර්මසහසත්වපාලනය | ·කෘෂිකර්ම(○)· පශුසම්පත්(○) | ධීවර | · මුහුදු වගාව(○)·වෙරළ සහ වෙරළාශ්‍රිත නොගැඹුරු මුහුදේ ධීවරකර්මාන්තය(○) |
| උපන් දිනය | . . . | දුරකථන අංකය | |
| ලියාපදිංචි දිනය | 20 . . | නම | ( අත්සන) |

**අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය**

*ඔබගේ පිළිතුර සටහන් කරන්න(●)

විදේශගත කරන ඒජන්සිය සඳහා

☐ රැකියා පලපුරුද්ද ( රැකියා පලපුරුද්ද ඇති අය සඳහා පමණි)

| වසරක් හෝ ඊට වැඩි | වසරකට අඩු |
|---|---|
| ○ | ○ |

| | |
|---|---|
| සත්‍ය | ○ |
| අසත්‍ය | ○ |

☐ පුහුණු සහ අධ්‍යාපනික පසුබිම කාලය -පැය ගණන ( පුහුණුව ලබා ඇති අය සඳහා පමණි)

| පුහුණුව | | අධ්‍යාපනික පසුබිම | |
|---|---|---|---|
| පැය 120 හෝ ඊට වැඩි | පැය 120 ට අඩු | විශ්ව විද්‍යාල උපාධිය සහ ඉන් ඉහළ | උසස් පාසලට හෝ පහළ |
| ○ | ○ | ○ | ○ |

| | |
|---|---|
| සත්‍ය | ○ |
| අසත්‍ය | ○ |

☐ සහතික ( සහතිකපත් ඇති අය සඳහා, සහතිකපත් දෙකකට වඩා නොවැඩි )

| අංකය | සහතිකයේ නම | නිකුත්කළ දිනය | ආයතනය/සංවිධානය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

| | |
|---|---|
| සත්‍ය | ○ |
| අසත්‍ය | ○ |

විදේශගත කරන ඒජන්සිය නම: ( අත්සන)

සම්මුඛ පරීක්ෂක නම: ( අත්සන)

* මුළු සේවා කාලය මාස වලින් සටහන් කළ යුතුය.

** පුහුණු පාඨමාලා සහතික පළමුව තහවුරු සහතික කළ යුතු අතර මුළු පුහුණු කාලය පැය ගණනින් සටහන් විය යුතුය.

*** අධ්‍යාපනික සහතිකය තෝරාගත් ක්ෂේත්‍රයට අදාළ විය යුතුය.

**** අව්‍යාජ ලෙස ලියකියවිලි සත්‍යාපනය කළ යුතු අතර මුළු සහතික ප්‍රමාණය ඉදිරිපත් කල යුතුය.